# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2021 ජනවාරි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2021 ජනවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2021 ජනවාරි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 33/2018

# 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1956 අංක 47 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු පිරිමි තරුණ අය" යන වචන වෙනුවට "පිරිමි තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසය සහ වයස අවුරුදු දහඅට අතර අය" යන වචන වෙනුවට "තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (5) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසය සහ වයස අවුරුදු දහඅට අතර අය" යන වචන වෙනුවට "තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු" යන වචන වෙනුවට "තරුණ අයකු" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (ආ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තිය මෙයින් ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ඉවත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ නොමැති කිසිදු ළමයකු හෝ තරුණ අයකු" යන වචන වෙනුවට "කිසිදු ළමයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "වයස අවුරුදු දහහතරට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු කිසිම තැනැත්තකු" යන වචන වෙනුවට "කිසිදු තරුණ අයකු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (4) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු" යන වචන වෙනුවට "තරුණ අයකු" යන වචන ආදේශ කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) "ළමයා" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු අදහස් වේ;";

(ආ) (ඇ) ඡේදයේ "කාර්මික ව්‍යවසාය" යන යෙදුමේ අර්ථකථනයේ "අවුරුදු දහහතර" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) "රාත්‍රී කාලය" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

"රාත්‍රී කාලය" -

(අ) ස්ත්‍රීන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන්, ප. ව. 10 සිට පෙ. ව. 5 දක්වා වූ කාලය ඇතුළුව යටත් පිරිසෙයින් අනුගාමී පැය එකොළහක කාලය අදහස් වේ; සහ

(ආ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන්, පෙ. ව. 6 ට පෙර අවසන් විය යුතු යටත් පිරිසෙයින් අනුගාමී පැය දොළහක කාලය අදහස් වන අතර,

(i) (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, වයස අවුරුදු දහසයකට එළඹ ඇති එවැනි තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ප. ව. 10 සහ පෙ. ව. 6 දක්වා වූ කාලය අතරට වැටෙන යටත් පිරිසෙයින් අනුගාමී පැය හතක කාලයක් ඇතුළත් වේ; සහ

(ii) වයස අවුරුදු දහසයකට එළඹ ඇති එවැනි තැනැත්තන් සහ බේකින් කර්මාන්තයේ වෘත්තීය පුහුණුවක නියැලෙන හෝ එම කර්මාන්තයේ ආධුනිකයන් වන තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, (i) වන අනුඡේදයේ සඳහන් යටත් පිරිසෙයින් අනුගාමී පැය හතක කාලය වෙනුවට සියලු සේවකයන් සඳහා රාත්‍රී කාලයේ දී එම කර්මාන්තයේ වැඩ කිරීම තහනම් කරනු ලබන්නේ නම්, ඊට ප. ව. 9 සහ පෙ. ව. 4 දක්වා වූ කාලය අතරට වැටෙන අනුගාමී පැය හතක කාලය ඇතුළත් වේ;";

(ඇ) "තරුණ අය" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

"තරුණ අය" යන්නෙන්, වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ."; සහ

(2) එහි (2) වන උපවගන්තියේ (අ) අනුඡේදයේ "අවුරුදු දාහතර" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.